# උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ කෘෂිකර්ම උපදේශක III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2026

උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ කෘෂිකර්ම උපදේශක III ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු 44ක් සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් මෙම කොමිෂන් සභාව විසින් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය 2026 පෙබරවාරි මස 27 දින වේ. මෙම විභාගය 2026 ...මාර්තු...මසදී අනුරාධපුර නගරයේදී පැවැත්වීමට නියමිත වේ.

02. බඳවා ගැනීම සිදු කරන අවස්ථාවේදි පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගන්නා සංඛ්‍යාව තීරණය කිරීමේ බලය උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය.

03. සුදුසුකම් :-

3.1. I. අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

II. සෑම අයදුම්කරුවෙකුම උතුරු මැද පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් සෑම අයුරකින්ම සුදුසු මනා ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ඨ චරිතයකින් යුක්ත අයෙකු විය යුතුය.

III. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

IV. යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

IV. අයදුම්පත් කැඳවනු ලබන අවසන් දිනට පූර්වාසන්න වසර 03 කට නොඅඩු කාලයක් උතුරු මැද පළාත තුළ ස්ථිරව හා අඛණ්ඩව පදිංචි අයෙකු විය යුතුය. කලත්‍රයාගේ ස්ථිර පදිංචිය වුවද සලකා බැලේ. <u>සුදුසුකම් සහිත ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් උතුරු මැද පළාත තුළින් තෝරාගැනීමට නොහැකි වුවහොත් පමණක්, උතුරු මැද පළාතේ අවම වශයෙන් අවුරුදු 05 ක් සේවයේ කිරීමට යටත්ව ජාතික මට්ටමින් අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන අයදුම්කරුවන් සම්බන්ධයෙන් සුදුසුකම් සළකා බලනු ඇත.</u>

V. සේවයට බඳවා ගැනීම සඳහා වන තරඟ විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු අදාල සියලු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබේ නම් පමණි.

3.2. අධ්‍යාපන සුදුසුකම් :-

මෙම අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට ප්‍රථම පහත සඳහන් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(අ). සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව,විද්‍යාව,ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව (සම්මාන 04) විෂයයන් 06 කින් අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගයෙන් එකවර සමත් වී තිබීම.

සහ

(ආ). කෘෂි විද්‍යාව ,ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, සත්ත්ව විද්‍යාව, ජෛව පද්ධති තාක්ෂණවේදය, ජෛව සම්පත් තාක්ෂණවේදය, කෘෂි තාක්ෂණවේදය යන විෂයයන්ගෙන් විෂයයන් දෙකක් ඇතුළුව විෂයයන් 03 කින් එකවර සමත් වීම.

(ඇ). I. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් විසින් පිරිනමනු ලබන දෑ අවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමා සහතිකය

හෝ

II. ඊකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ6) මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම

හෝ

III. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් නිකුත් කරනු ලබන තාක්ෂණ සහතික සහ ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියලු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාල දෑ අවුරුදු තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

04. වැටුප් ක්‍රමය :-

මෙම තනතුරට හිමි වැටුප් පරිමාණය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 ට අනුව MN3 – 2025 යටතේ රු.52,250-10x800-1,190-10x1,320-10x1,350-100,040 වේ. ඊට අමතරව රජයේ අනුමත ජීවන වියදම් දීමනාව මාසිකව ගෙවනු ලැබේ.

05. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-

(අ) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් විටින් විට ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට යටත්වනු ඇත.

(ආ) තෝරා ලනු ලබන අයදුම්කරුවන් එම අවස්ථාව වන විට රාජ්‍ය සේවයේ තනතුරක ස්ථිර කර නොසිටියේ නම් ඔවුන් තුන් අවුරුදු පරිවාස කාලයකින් පසුව නියමිත කාර්යක්ෂමතා කඩඉම් සමත්වීම සම්පූර්ණ කිරීමෙන් පසු අදාළ තනතුරෙහි ස්ථිර කරනු ඇත. රාජ්‍ය සේවයේ නියුතු ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත නිලධාරියෙකු නම් ඔහුගේ පත්වීම එක් අවුරුදු වැඩබැලීමේ කාලයකට යටත්වනු ඇත.

06. භාෂා මාධ්‍ය

විභාගය සිංහල, දෙමළ , භාෂා මාධ්‍ය දෙකෙන්ම පැවැත්වේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

07. අයදුම්පත්‍ර :-

(අ). මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව $A_4$ (සෙ.මි.21x30) ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත්‍රය සකස් කළ යුතුය. අංක 01 සිට 03 දක්වා ශීර්ෂ පළමු වන පිටුවෙහිද, අංක 04 සිට 08 දක්වා ශීර්ෂ දෙවන පිටුවටද,ඉතිරිය ඊළඟ පිටුවලටද ඇතුළත් වන පරිදි සකස් කර ඊට අදාළ තොරතුරු තම අත්අකුරෙන්ම පැහැදිළිව සම්පූර්ණ කළ යුතුය.

(ආ). ඉල්ලුම්පත්‍රය සකස් කළ යුත්තේ තමා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙනි.

(ඇ). රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නියුතු ඉල්ලුම්කරුවන් තම අයදුම්පත දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතුය.

(ඈ). මූලික සුදුසුකම් සපුරා නොමැති, ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති හා අයදුම්පත්‍ර කැඳවන අවසාන දිනට පසුව මුදල් ගෙවූ කුවිතාන්සි ඇතුළත් අයදුම්පත්,උතුරු මැද පළාතේ දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාල හැර වෙනත් ස්ථානවලට මුදල් ගෙවූ රිසිට්පත් සහිත අයදුම්පත්, මුදල් ගෙවූ කුවිතාන්සි අලවා නොමැති අයදුම්පත් හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිදු පූර්ව දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේදී අස්ථානගත වන හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් පිළිබඳව මෙම කොමිෂන් සභාව වගකියනු නොලැබේ. අයදුම්පත් ලද බව හෝ ප්‍රතික්ෂේප කළ බව අයදුම්කරුවන් වෙත දන්වනු නොලැබේ.

(ඉ). අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරණ නිලධාරියෙකු හෝ රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

(ඊ). නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2026 පෙබරවාරි 27 දිනට පෙර "ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,උතුරු මැද පළාත, අනුරාධපුර" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරේ "උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ කෘෂිකර්ම උපදේශක III

ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීම(විවෘත) තරඟ විභාගය - 2026 " (ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය සඳහන් කරන්න) යන්න සඳහන් කළ යුතුය. (ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

08. විභාග ගාස්තු :-

(අ). මෙම විභාගය සඳහා අයදුම්කරන සෑම අයදුම්කරුවෙකු විසින්ම විභාග ගාස්තු ලෙස රු. 720/- ක මුදලක් උතුරු මැද පළාත් සභාවේ ආදායම් ශීර්ෂ අංක 2003.02.13ට බැර වන පරිදි (එන්සී 100 ආකෘතිය මඟින්) උතුරු මැද පළාත තුළ පිහිටි ඕනෑම දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ලබා ගන්නා ලදුපත අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. මෙම දැන්වීමේ සඳහන් නොවන අයුරින් මුදල් ගෙවා ලබා ගන්නා ලද ලදුපත් සහිත අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන අතර, කුමන හේතුවක් නිසාවත් ගෙවන ලද විභාග ගාස්තු ආපසු ගෙවීමකින් හෝ මාරු කිරීමක් සිදු කරනු නොලැබේ. විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් බාරගනු නොලබන අතර, තැපැල් හෝ උප තැපැල් කාර්යාලවලට ගෙවන ලද මුදල්ද භාරගනු නොලැබේ.

(ආ). පුවත්පත් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන්ට තරඟ විභාගයට පෙනී සිටීමට උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉඩ දෙනු ලැබේ. තරඟ විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා ගැසට් නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

(ඇ). විභාගයට පෙනි සිටින අපේක්ෂකයින් විසින් විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශපත්‍ර ඉදිරිපත් කළ යුතුය. තවද, අපේක්ෂකයින් විභාග ශාලාව තුළදී පෙනී සිටින සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහාම විභාග ශාලාධිපති සෑහීමට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය තහවුරු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය

විභාගය පැවැත්වීමට නියමිත දිනට දින 07කට කලින් විභාග ප්‍රවේශපත්‍ර නොලදහොත් එම අපේක්ෂකයින් පහත සඳහන් විස්තර ඇතිව උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලියා හෝ දුරකථන අංක 025-2222773 ඔස්සේ දැන්විය යුතුය.

i. විභාගයේ නම
ii. අයදුම්කරුගේ සම්පූර්ණ නම
iii. සම්පූර්ණ ලිපිනය
iv. ඉල්ලුම්පත් තැපැල් කළ කාර්යාලය සහා ලියාපදිංචි කළ අංකය හා දිනය

අයදුම්පත් නොලැබීම හෝ අස්ථාන ගතවීමක් හේතුවෙන් ප්‍රවේශපත්‍ර නොලැබී ගිය හොත් ප්‍රවේශපත්‍රය ලබා ගැනීමට අයදුම්පත්‍රයේ පිටපතක් සමඟ ලිහාපදිංචි කළ කුවිතාන්සියේ පිටපතක් රැගෙන කොමිෂන් සභා කාර්යාලයට අයදුම්කරු හෝ අයදුම්කාරිය විසින්ම පැමිණිය යුතුය.

09.තෝරා ගැනීමේ ක්‍රමය :-

(අ). රා.ප.එ.15/90 හි විධිවිධාන පරිදි දිස්ත්‍රික් ජනගහන අනුපාතය අනුව අනුරාධපුර හා පොළොන්නරුව යන දිස්ත්‍රික්කයන්හි පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ. මේ සඳහා
උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන ලිඛිත පරික්ෂණයක ලකුණු ප්‍රමුඛතාවය මත සුදුස්සන් තෝරා ගැනේ. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දීමක් සිදු නොවන අතර, ලිඛිත විභාගයේදී එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා 40% අවම ලකුණු ප්‍රමාණයක් ලබා නොගන්නා අයදුම්කරුවන් බඳවා ගැනීම සඳහා සළකා බලනු නොලැබේ. එක් එක් ප්‍රශ්න පත්‍රයට 40% ක් හෝ ඊට වැඩි ලකුණු ලබාගත් අයදුම්කරුවන් අතුරින් ලකුණු කුසලතාවය අනුව ප්‍රමුකතා ලේඛනයක් සකස් කර ඉහළම සුදුසුකම් ඇති පුද්ගලයන් අනුපිළිවෙලින් තොරා ගනු ලැබේ.

සටහන :- ප්‍රමුඛතා ලේඛණයක් සකස් කිරීමේදී උතුරු මැද පළාත හා වෙනත් පළාත සඳහා වෙන වෙනම ප්‍රමුඛතා ලේඛණය සකස් කරනු ලබන අතර, උතුරු මැද පළාත් ප්‍රමුඛතා ලේඛණයට අනුව අවම සමත් ලකුණු දරන අයද තෝරා ගැනීමෙන් පසු වෙනත් සුදුසුකම්ලාභීන් පිළිබඳව සලකා බලනු ලැබේ.

10. විභාග ක්‍රමය :-

මෙම විභාගය පහත සඳහන් පරිදි ලිඛිත ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.

1. බුද්ධි පරීක්ෂණය - කාලය පැය 01 යි ( ලකුණු 100)
2. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය - කාලය පැය 03 යි ( ලකුණු 100)

විෂය නිර්දේශය

බුද්ධි පරීක්ෂණය

අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාව විශ්ලේෂණ හැකියාව, කාල කළමනාකරණය, විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය. සමත්වීම සඳහා 40% හෝ ඊට වඩා වැඩි ලකුණු ප්‍රමාණයක් ලබාගත යුතුය.

විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය

අපේක්ෂකයාගේ තාක්ෂණික දැනුම මැන බැලීම සඳහා වූ ප්‍රශ්නවලින් සමන්විත වේ.(විෂය නිර්දේශය පහත පරිදි වේ)

i. ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා කෘෂි කර්මාන්තයේ දායකත්වය
ii. ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප පිළිබඳ දැනුම
iii. පස හා ශාක පෝෂණය
iv. වී නිෂ්පාදනය
v. වෙනත් ක්ෂේත්‍ර භෝග නිෂ්පාදනය
vi. එළවළු නිෂ්පාදනය
vii. පළතුරු
viii. භෝග ආරක්ෂණය
ix. පාංශු රසායනය, පාංශු සංරක්ෂණයේ වැදගත්කම හා විවිධ පාංශු සංරක්ෂණ ක්‍රම
x. වාරිමාර්ග ක්‍රම හා ජල කළමනාකරණය
xi. ගොවිපල යාන්ත්‍රීකරණය
xii. මී මැසි පාලනය
xiii. මල්වගාව හා භූමි අලංකරණය
xiv. ආරක්ෂිත භෝග වගාව
xv. සත්ත්ව පාලනය
xvi. කෘෂිකාර්මික ව්‍යාප්තිය
xvii. පටක රෝපණය
xviii. පැළෑටි නිරෝධායනය පිළිබඳ දැනුම

xix. අ.ශාඛ සංරක්ෂණයේ වැදගත්කම (ශාක/ජාන ප්ලාස්ම)
 ආ.ශාඛ සංරක්ෂණ ක්‍රම (ශාක/ජාන ප්ලාස්ම)

xx. ජාන තාක්ෂණය

xxi. කෘෂිකර්ම සංවර්ධනය (වර්තමාන කෘෂිකර්ම සංවර්ධන ප්‍රතිපත්තිය, ඒවායේ ඇති වැදගත් කෘෂිකර්ම සංවර්ධන වැඩසටහන්, කෘෂිකර්ම සංවර්ධනය සම්බන්ධ කෘෂිකර්ම අමාත්‍යංශය යටතේ ඇති දෙපාර්තමේන්තු හා වෙනත් ආයතන, මධ්‍යම රජයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් ආයතන, මධ්‍යස්ථාන, අංශ ඒකක හා ඒවායේ කාර්යය භාරය, කෘෂිකර්ම ක්ෂේත්‍රයේ වර්තමාන ගැටළු හා අභියෝග, කෘෂිකාර්මික සංවර්ධනයට ආධාරවන ආකාරය, කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහන්

11. සාවද්‍ය තොරතුරු ලබාදීම :-

මෙම විභාගයට ඉදිරිපත්වීම සඳහා කිසියම් අපේක්ෂයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. සේවයට බඳවා ගත් පසුව වුවද, අපේක්ෂකයෙකු ඉදිරිපත් කළ කිසියම් තොරතුරක් සාවද්‍ය බව සනාථ වුවහොත් ඔහු සේවයෙන් පහකිරීමට ඉඩ ඇත.

12. බඳවා ගැනීමේ කොන්දේසි තනතුරට අදාල උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ බඳවා ගැනීමේ පරිපාටියට අනුව බඳවා ගැනීමේ කොන්දේසි තීරණය වේ. මෙම දැන්වීමේ දෙමළ පරිවර්තනයේදී ඇතිවන අනනුකූලතාවයන් සම්බන්ධයෙන් සිංහල නිවේදනය බල පැවැත්වේ)

ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු මැද පළාත.
අනුරාධපුර.
2026.02.